# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1988 අංක 67 දරන
# ශ්‍රී ලංකා කළමනාකරණ ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත

---

[සහතිකය සටහන් කළේ 1988 දෙසැම්බර් මස 17 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---


1988 දෙසැම්බර් මස 23 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක.

මිළ : ශත 60 යි. තැපැල් ගාස්තුව : ශත 75 යි.

## 1988 අංක 67 දරන ශ්‍රී ලංකා කළමනාකරණ ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 1988 දෙසැම්බර් මස 17 වන දින]

එල්. ඩී.—ඕ. 50/87

**ශ්‍රී ලංකා කළමනාකරණ ආයතනය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.**

"ශ්‍රී ලංකා කළමනාකරණ ආයතනය" යනුවෙන් සඳහන් කරනු ලබන සහ හඳුන්වනු ලබන ආයතනයක් ඒ ආයතනයේ සාමාජිකයන් එකඟ වූ රීති සහ අතුරු ව්‍යවස්ථා වලට අනුව, ඒ ආයතනයට සම්බන්ධ සියලු පරමාර්ථ සහ කරුණු ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීමේ සහ කරගෙන යාමේ කාර්ය සඳහා මෙතෙක් කල් ශ්‍රී ලංකාවේ පිහිටුවා තිබුණු හෙයින් ද: **පූර්විකාව.**

එකී ආයතනය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ සහ කරුණු සඳහා ද ඒ පරමාර්ථ සහ කරුණු එකී ආයතනය විසින් මෙතෙක් කල් සාර්ථක ලෙස ක්‍රියාත්මක කර සහ ඉටු කර ඇති හෙයින් සහ එකී ආයතනය සංස්ථාගතකිරීමට ඉල්ලුම් කර ඇති හෙයින් ද ඒ ඉල්ලීම ඉෂ්ට කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 1988 අංක 67 දරන ශ්‍රී ලංකා කළමනාකරණ ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට සහ ඉන්පසු (මෙහි මින්මතු "ආයතනය" යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා කළමනාකරණ ආයතනයේ දැනට සාමාජිකයන්ව සිටින තාක් නැනැත්තන් හෝ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින් මතු ඇතුළත් කරනු ලබන සාමාජිකයන් (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) "ශ්‍රී ලංකා කළමනාකරණ ආයතනය" යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු ය. තව ද එකී නාමයෙන් ඒ සංස්ථාව විසින් ද එයට විරුද්ධව ද සියලු අධිකරණ වල දී නඩු පවරනු ලැබිය හැකි අතර පොදු මුද්‍රාවක් තබා ගෙන එය පාවිච්චි කිරීමෙ ද ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද බලය හා අධිකාරය ඒ සංස්ථාවට ඇත්තේ ය. ශ්‍රී ලංකා කළමනාකරණ ආයතනය සංස්ථාගත කිරීම.

3. සංස්ථාව සංස්ථාපනය කිරීමට අරමුණු කොට ගත් පොදු පරමාර්ථ පහත දැක්වේ:— සංස්ථාවේ පොදු පරමාර්ථ.

(අ) තමන්ගේ ම ක්‍රියාකාරකම් මගින් හා සාමාජික ආයතනවල හා සංවිධානවල ක්‍රියාකාරකම් මගින්, කළමනාකරණ ක්ෂේත්‍රවල පර්යේෂණ, අධ්‍යයන, සාකච්ඡා, පුහුණු කිරීම් හා සංවර්ධන කටයුතු නංවාලීමෙන් සියලු සාමාජිකයන් අතර වෘත්තීය කළමනාකරණය වැඩි දියුණු කිරීම;

(ආ) කළමනාකරණයේ විවිධ කාර්යබද්ධ ක්ෂේත්‍ර නියෝජනය කරන ආයතන සමග සහයෝගයෙන් හා සම්බන්ධීකරණයෙන් ක්‍රියා කිරීම හා ඒවායේ අර්ථ සිද්ධිය ක්‍රියාකාරකම් හා කටයුතු නංවාලීම;

(ඈ) මෙරට නියෝජනය වී නැති කළමනාකරණ ක්ෂේත්‍රවල ආයතන ඇති කිරීමට සහ සංවර්ධනය කිරීමට ආධාර කිරීම ;

(ඇ) ශ්‍රී ලංකාවේ සංවර්ධනය සඳහා ඵලදායි කළමනාකරණයෙහි වැදගත්කම පිළිබඳ මහජනතාවගේ උනන්දුව හා අවබෝධය වැඩි දියුණු කිරීම ;

(ඉ) කළමනාකරණයේ විවිධ ක්ෂේත්‍ර නියෝජනය කෙරෙන මණ්ඩලවලට සාමාජිකත්වය ලබා ගැනීම සඳහා ධෛර්ය දීමෙන් සංස්ථාවේ ප්‍රතිපත්ති හා තීරණ සකස් කරන ව්‍යුහයන් පුළුල් පදනමකින් යුක්තව නියෝජනාත්මක බවට පත් කිරීම ;

(ඊ) සංස්ථාවේ පරමාර්ථ සාක්ෂාත් කර ගැනීම හා කටයුතු කර ගෙන යාම සඳහා ලේකම් කාර්යාලයක් පිහිටුවීම ;

(උ) එහි සමාජිකයන් සඳහා චර්යා සංග්‍රහයක් ඇති කිරීම හා එය ඔවුන් ලවා අනුගමනය කරවීමට උත්සුක කිරීම ;

(ඌ) කළමනාකරණ කර්තව්‍යය හා බැඳී ඇති ප්‍රාදේශීය සහ ජාත්‍යන්තර මණ්ඩල සමග නියෝජිත සම්බන්ධතා ඇති කිරීම හා දියුණු කිරීම ;

(එ) සංස්ථාවේ සාමාජිකයන් අතර සුහදකම, අන්‍යෝන්‍යතා හා පොදු හැඟීම් ඇති කරන ක්‍රියාකාරකම් ආරම්භ කිරීම ;

(ඒ) කළමනාකරණය පිළිබඳ පාඨමාලා සහ විභාග පැවැත්වීම ;

(ඔ) සංස්ථාවේ සියලු පරමාර්ථ හෝ ඉන් කිසිවක් ඉටු කර ගැනීම පිණිස අවශ්‍ය විය හැකි වෙනත් යම් පියවර ගැනීම.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

4. මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත් ව, බැංකු ගිණුම් ආරම්භ කිරීම, ක්‍රියාත්මක කිරීම, සහ වැසීම, ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීම හෝ ලබා ගැනීම, ප්‍රදානයන් හා පරිත්‍යාග භාර ගැනීම හෝ එකතු කිරීම, සංස්ථාවේ අරමුදල් ආයෝජනය කිරීම සහ සංස්ථාවේ පරමාර්ථ ඉටුකිරීම සඳහා අවශ්‍ය නිලධරයන් සහ සේවකයන් සේවයට බඳවා ගැනීම, සේවයේ නියුක්ත කිරීම සහ සේවයෙන් නෙරපීම ද ඇතුළුව, සංස්ථාවේ සියලුම පරමාර්ථ හෝ ඉන් යම් පරමාර්ථයක් හෝ උන්නතියට පත් කර ගැනීම සඳහා සහ සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය හෝ යෝග්‍ය සියලු ක්‍රියා, කරුණු සහ දේ කිරීමේ, ඉටු කිරීමේ සහ ක්‍රියාත්මක කිරීමේ බලය සංස්ථාවට ඇත්තේ ය.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

5. (1) සංස්ථාවේ කටයුතු, සංස්ථාවේ නිලධරයන්ගෙන් සහ සංස්ථාවේ රීතිවලින් විධිවිධාන සලස්වා ඇති පරිදි වූ සහ ඒ රීතිවලට අනුකූලව තෝරා පත්කර ගනු ලබන සෙසු තැනැත්තන්ගෙන් සමන්විත සභාවක් විසින් ඒ රීතිවලට යටත් ව පරිපාලනය කළ යුතු ය.

(2) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයේ දී ධූර දරන ආයතනයේ සභාව, සංස්ථාවේ ප්‍රථම සභාව විය යුතු ය.

සංස්ථාවේ රීති.

6. (1) සාමාජිකයන් ඇතුළත් කරගැනීම, ඉල්ලා අස්වීම හෝ නෙරපීම, සාමාජිකයන් වර්ග කිරීම හා රැස්වීම්වල දී ඡන්දය දීමට ඔවුන්ගේ හිමිකම, සංස්ථාවේ සභාවේ සහ විවිධ නිලධරයන්ගේ අනුයෝජිතයන්ගේ හා සේවකයන්ගේ කාර්ය ඉටුකිරීම, සංස්ථාවේ කටයුතු කරගෙන යාමේ දී අනුගමනය කළයුතු කාර්ය පරිපාටිය සහ සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු පාලනය කිරීම සඳහා හා එහි පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම සඳහා, සංස්ථාව විසින්, කලින් කල, සාමාජිකයන්ගේ විශේෂ මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු ඡන්දයෙන් මේ පනතේ හා වෙනත් යම් ලිඛිත නීතියක විධි විධානවලට අනනුකූල නොවන රීති සෑදීම නීත්‍යානුකූල වන්නේ ය. එකී රීති සෑදීමෙන් පසු එවැනි ම රැස්වීමක දී එවැනි ම ආකාරයෙන් ඒවා වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම, ඒවා සංශෝධනය කිරීම හෝ පරිච්ඡින්න කිරීම කළ හැකි ය.

(2) සංස්ථාවේ සාමාජිකයන් සංස්ථාවේ රීතිවලට යටත් විය යුතුය.

ආයතනයෙන් ගෙවිය යුතු සහ ආයතනයට අයවිය යුතු ණය.

7. මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භවන දිනයට පෙරාතුවම වූ දිනයේදී ආයතනයේ පැවති සියලු ම ණය සහ බැරකම් මෙයින් සංස්ථාපනය කරනු ලැබූ සංස්ථාව විසින් ගෙවිය යුතු අතර, ආයතනයට අය විය යුතු සියලු ණය සහ ආයතනයට ගෙවිය යුතු සියලු සාමාජික මුදල් හා දායක මුදල් මේ පනතේ කාර්ය සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

දේපළ දැරීමට සංස්ථාව සතු බලය.

8. යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, තෑගි කිරීමක් හෝ බදු දීමක් පිළිබඳ සාධන පත්‍රයක් ප්‍රකාර හෝ අන්තිම කැමති පත්‍රයකින් දේපළ බැහැර කිරීමක් ප්‍රකාර හෝ වෙනත් ආකාරයකින් හෝ සංස්ථාව වෙත සතු වන්නා වූ යම් චංචල හෝ නිශ්චල දේපළක් අත් කර ගැනීමට සහ දැරීමට නීතියෙහි ලා සංස්ථාවට බලය ඇති අතර, ඒ දේපළ විකිණීමට, උකස් කිරීමට, බදු දීමට, හුවමාරු කිරීමට හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමට හෝ බැඳීමකට යටත් කිරීමට පූර්ණ බලය ඇතිව, සංස්ථාවේ තත්කාලයේ බලපවත්නා රීතිවලට යටත්ව, මේ පනතේ කාර්ය සඳහා සංස්ථාව විසින් ඒ සියලු දේපළ දැරිය යුතු ය.

වෘත්තීය ප්‍රමිති.

9. සංස්ථාවේ සාමාජිකයන් අතර වෘත්තීය ප්‍රමිති හා විනය පවත්වා ගෙන යාම සඳහා අවශ්‍ය වන්නාවූද මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන්නා වූද පියවර කලින් කල ගැනීමට සංස්ථාවට බලය ඇත්තේ ය.

**සංස්ථාවේ මුද්‍රාව.**

**10.** සංස්ථාවේ මුද්‍රාව ලේකම්වරයාගේ ආරක්ෂා භාරයේ තිබිය යුතු ය. තවද මණ්ඩලයේ බලය කලින් ලබා ගෙන සහ මණ්ඩලය විසින් නම් කරන ලද නිලධරයන් දෙදෙනකු ඉදිරිපිට දී මිස කිසිම සාධන පත්‍රයකට මණ්ඩලයේ මුද්‍රාව තබනු නොලැබිය යුතු අතර ඒ නිලධරයන් විසින් තමන් පැමිණ සිටි බවට සලකුණක් වශයෙන් එකී සාධන පත්‍රයෙහි තම නම් අත්සන් කළ යුතු ය. ඒ අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමට පරිබාහිර විය යුතු ය.

**සාමාජිකයන්ගේ වගකීම සීමා කිරීම.**

**11.** සංස්ථාවේ සාමාජිකයකුගෙන් සංස්ථාවට සාමාජික මුදල් වශයෙන් අය විය යුතු මුදලට වැඩි දායක මුදල් කිසිවක් සංස්ථාවේ ණය හා බැරකම් පියවීමේ කාර්ය සඳහා ගෙවීමට සංස්ථාවේ කිසිම සාමාජිකයකු යටත් නොවිය යුතු ය.

**ජනරජයේ හා අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.**

**12.** මේ පනතේ සඳහන් තැනැත්තන්ගේ සහ ඔවුන් මගින්, ඔවුන්ගෙන් හෝ ඔවුන් යටතේ හිමිකම් පාන්නවුන්ගේ අයිතිවාසිකම්වලට හැර ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තකුගේ හෝ අයිතිවාසිකම්වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවන්නේ ය.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 177 කි. (විදේශීය) රු. 236 කි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.